De Silva, L. Nalin K.
Department of Mathematics, University of Kelaniya

*Paper: Transformability*

# කාළාම සූත්‍රයට අනුව කාළාම සූත්‍රය යොදා ගැනීම

කාළාම සූත්‍රයට අනුව පොතක පතක තිබූ පමණින් , ඇසූ පමණින් අප යමක් විශ්වාස නොකළ යුතු ය. එහෙත් කාළාම සූත්‍රය ද අප දන්නේ එක්කෝ පොතපතෙනි. එසේත් නැත්නම් ඇසීමෙනි. එසේ නම් අප කාළාම සූත්‍රය පිළිගත යුත්තේ ඇයි?

මෙහි දී අපේ ආධාරයට ඇති වචනයක් නම් පමණින් යන්නේ ය. අප කාළාම සූත්‍රය පිළිගන්නේ එය පොතපතෙහි සඳහන් නිසා පමණක් නො වේ යැයි කෙනකුට තර්ක කළ හැකි ය. එහෙත් එසේ කීම ප්‍රමාණවත් නොවේ ය යන්න කතුවරයාගේ මතය වෙයි.

මෙම පරස්පරය විසඳාගැනීමට එක් පැත්තකින් අපට ඇරිස්ටෝටලීය න්‍යායෙහි ඇති ඌණතාව පෙන්විය හැකි ය. ඒක රේඛීය වූ ඇරිස්ටෝටලීය න්‍යායෙහි මෙවැනි පරස්පරවලට විසඳුම් නැත. මෙම පත්‍රිකාවෙහි එය පැහැදිලි කෙරෙන අතර කාළාම සූත්‍රයෙහි අගභාගයෙන් පරස්පරය විසඳීමට හා කාළාම සූත්‍රය සම්බන්ධයෙන් කෙරෙන බටහිර විද්‍යාත්මක විවරණවල පුහු බව පෙන්වීමට අගනා ආධාරයක් ලැබෙන බව පෙන්වා දෙනු ඇත.